**හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම - 2022**
**-----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**අවධාරණය කරණු ලබන කරුණ**

මාගේ මතයට බලපෑමක් සිදු නොකර, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී වන අඛණ්ඩ පැවැත්ම පදනම දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල අංක 2.5 සටහන වෙත අවධානය යොමු කරමි. අපේක්ෂා කරන ලද ඉදිරි අනාගතයේදී සමාගම ඈවර කිරීමට තීරණය කර නොමැති අතරම ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාරීත්වය රේඛීය අමාත්‍යාංශයෙන් උපදෙස් අපේක්ෂා කරනු ඇත. එබැවින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සකස් කර ඇත. කෙසේ වෙතත්, හම්බන්තොට හෝටල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය නවතා දැමීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2015 වර්ෂයේදී තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු නවතා දමා ඇත. තවද, රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය විසින් 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ (මව් සමාගම) කොටස් හිමිකාරීත්වයේ කොටස පැවරීමට උපදෙස් ලබා දී ඇත. මෙම වැඩසටහන වාර්තා කරන දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, 2023 මාර්තු 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 23/0431/604/046 ට අනුව, කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම සතු හිමිකාරිත්වය හා ලිට්රෝ ගෑස් සමාගම සතු හිමිකාරීත්වය වහාම ක්‍රියාත්මක වන පරිදි මහා භාණ්ඩාගාරය වෙත පැවරීමට කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ

වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේදී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නවතා දැමීමට සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු නවතා දමා ඇත. තවද, රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය විසින් 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කැන්විල් හෝල්ඩින් පුද්ගලික සමාගමේ (මව් සමාගම) කොටස් හිමිකාරිත්වයේ කොටස පැවරීමට උපදෙස් ලබා දී ඇත. තවද, 2023 මාර්තු 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 23/0431/604/046 ට අනුව, කැන්විල් හෝල්ඩින් පුද්ගලික සමාගමෙහි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම සතු හිමිකාරිත්වය හා ලිට්රෝ ගෑස් සමාගම සතු හිමිකාරීත්වය වහාම ක්‍රියාත්මක වන පරිදි මහා භාණ්ඩාගාරය වෙත පැවරීමට කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. මෙම වැඩසටහන වාර්තා කරන දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 ජනවාරි මස 17වන දිනැති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ලබාගත් තීරණය අනුව, හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම ග්‍රෑන්ඩ් හයට් (Grand Hyatt) ආයෝජන සැලැස්මෙන් ඉවත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයෙහි මතය විය.<br><br>කැන්විල් හෝල්ඩින් පුද්ගලික සමාගම සහ එහි අනුබද්ද සමාගම් දෙක ඉවත් කිරීම, එහිදී හෙලන්කෝ හොටෙල් හා පුද්ගලික සමාගම කැන්විල් හෝල්ඩින් පුද්ගලික සමාගමේ අනුබද්ධිත සමාගමකි, 2023 මාර්තු 14දින අමාත්‍යමණ්ඩල අනුමැතියට සමගාමී විය. | අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ හයට් රිජන්සි හම්බන්තොට හෝටලය ඉදිකර සත්කාරක සේවා සැපයීමේ නිරත වීමයි. සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2015 වර්ෂයේදී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කරන ලදී. එහි ප්‍රතිපලයක් ලෙස, හෝටලය ඉදිකිරීමේ කටයුතු නවතාදැමීමට සමාගමට සිදුවී ඇති අතර ඉදිරි කටයුතු සඳහා සමාගම විසින් රේඛීය අමාත්‍යාංශයේ අවශ්‍ය උපදෙස් අපේක්ෂාවෙන් සිටිනු ඇත.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,131,676 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.11,875,894ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිපලයෙහි රු.255,782 වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මූල්‍ය ආදායම ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වසර පහ සඳහා ආදායම්, පරිපාලන වියදම් සහ ශුද්ධ ලාභ/අලාභ වල ප්‍රතිශතක විචලනයන් සහිත විශ්ලේෂණය සහ අඩු වැඩි වීමේ ප්‍රතිශතයන් පහත පරිදි වේ.

| වර්ෂය | 2022 | 2021 | 2020 | 2019 | 2018 |
|---|---|---|---|---|---|
| මුළු ආදායම රු. | 20,638,644 | 20,044,189 | 21,624,281 | 39,142,280 | 49,770,092 |
| අදායම් වැඩිවීමේ /(අඩුවීමේ) ප්‍රතිශතය | 3% | -7% | -45% | -21% | -44% |
| පරිපාලන වියදම් රු. | 4,354,515 | 4,418,012 | 3,918,547 | 4,003,549 | 6,415,872 |
| පරිපාලන වියදම් වැඩිවීමේ /(අඩුවීමේ) ප්‍රතිශතය | 1% | 13% | -2% | -38% | -13% |
| බදු පසු ශුද්ධ ලාභය / (පාඩුව) රු. | 12,131,676 | 11,875,894 | 13,456,358 | 25,299,887 | 31,848,469 |
| බදු පසු ශුද්ධ ලාභය/ අලාභය වැඩිවීමේ/(අඩුවීමේ) ප්‍රතිශතය | 2% | -12% | -47% | -21% | -50% |

### 2.3 අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ලබා දී ඇති තොරතුරු අනුව, පසුගිය වසර පහ සඳහා වැදගත් අනුපාත පහත පරිදි වේ.

| අනුපාතය | 2022 | 2021 | 2020 | 2019 | 2018 |
|---|---|---|---|---|---|
| ශුද්ධ වත්කම් වැඩිකිරීම / (අඩුවීම) | 1.11% | 1.75% | 2.02% | 3.95% | 4.03% |
| ශුද්ධ මූල්‍ය ආදායමේ වැඩි වීම / අඩු වීම | 2.97% | -7.27% | -44.77% | 0.01% | 55.59% |
| කොටසක ඉපයීම රු. | 0.24 | 0.24 | 0.27 | 0.51 | 0.64 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාරයක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යවසාය දෙපාරතුමේන්තුව විසින් ලබා දී ඇති නියෝග අනුව, සමාගම විසින් කිසිදු ලිඛිත ගිවිසුමක් නොමැතිව සිනෝලංකා හොටෙල් සහ ස්පා පුද්ගලික සමාගම වෙත කෙටි කාලීන ණයක් ලෙස රුපියල් මිලියන 400ක මුදලක් 8.79% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ ලබාදී තිබුණි. (රුපියල් මිලියන 300 ක් 2018 ජනවාරි 12 දින ලබා දී ඇති අතර රුපියල් මිලියන 100 ක් 2018 ජනවාරි 18 වන දින ලබා දී ඇත). මේ සඳහා සමාගම විසින් රු.මි. 126.07 පොලී අදායමක් ලැබිය යුතු බව මූල්‍ය ප්‍රකාශ තුල පෙන්නුම් කර තිබුනද, විගණිත දිනයවන විටත් සිනෝලංකා හොටෙල් සහ ස්පා පුද්ගලික සමාගම විසින් මෙම ප්‍රමාණය පියවා නොතිබුණි. | මෙම ණය මුදල ආපසු ගෙවීමට සිනෝ ලංකා හොටෙල් සහ ස්පා පුද්ගලික සමාගම හට අරමුදල් නොමැති අතර ග්‍රෑන්ඩ් හයට් (Grand Hyatt) ව්‍යාපෘතියෙන් වෙන් කිරීම සඳහා ප්‍රතිපාදන ලැබූ පසු පොළී අනුපාත පිළිබදව සාකච්ඡා කිරීමෙන් පසුව මෙම ණය මුදල පියවීමට කටයුතු යොදනු ඇත. | අන්තර් සමාගම් ගනුදෙනු සඳහා කළමනාකරණයට නිසි ප්‍රතිපත්තියක් තිබිය යුතුය. |

### 3.2 නිෂ්ක්‍රිය හෝ ඌනඋපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම රුපියල් මිලියන 177.97 ආයෝජනයකර හෙක්ටයාර් 3.8 ඉඩමක් බදු පදනම මත නාගරික සංවර්ධන අධිකාරියෙන් අත්පත් කරගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම ඉඩම කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි. | සැලසුම්කල හම්බන්තොට හයිට් රෙජෙන්සි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා මෙම නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම ඌන උපයෝගිව පැවතුණි. කෙසේවෙතත් ඉදිරි කටයුතු පිළිබද උපදෙස් ලබාදෙන ලෙස අප විසින් අවස්ථා ගණනාවකදී රේඛීය අමාත්‍යංශයට නීතිමය මතයද සමග ඉල්ලීම් කීපයක් යොමු කර ඇත. මේ පිළිබදව මේ දක්වා අපහට ධනාත්මක ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් එකගතාවයකට පැමිණිය යුතු බව දන්වා ඇති අතර 2023 ජනවාරි මස ග්‍රෑන්ඩ් හයිට් ව්‍යාපෘතියෙන් ඉවත්වීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයක් කර ඇත. | මෙම දේපල අපේක්ෂිත අරමුණ සඳහා හෝ වෙනත් ප්‍රයෝජනයවත් අරමුණක් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සමාගම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබිණි. | ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක නොවීම නිසා ඉදිරිකටයුතු පිළිබද උපදෙස් නොතිබුන බැවින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොතිබුණි. මෙම සමාගමෙහි ක්‍රියාකාරකම් නො◌ාමැති අතර කාර්යමණ්ඩලයක් අනුයුක්ත කර නොමැත. එක් ආරක්ෂක නිලධාරියකු ඉඩමේ ආරක්ෂාවට පැය 24 පුරාවටම දීමනාවක් ගෙවමින් යොදවා ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට වහා පියවර ගත යුතුය. |